
# ශ්‍රී ලංකා මහ බැංකුව
# இலங்கை மத்திய வங்கி
# CENTRAL BANK OF SRI LANKA

ශ්‍රී ලංකා මහ බැංකුවේ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ මුදල් සහ බැංකු කටයුතු, ගෙවුම් ශේෂ, සහ මූර්ත අංශය සඳහා ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥයින් ලෙස එක් වීමට උනන්දුවක් දක්වන වෘත්තිකයින්ගෙන් ශ්‍රී ලංකා මහ බැංකුව අයදුම්පත් කැඳවයි

# ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥ

## ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව



## 1.0 කාර්යය/වගකීම්

- තොරතුරු සහ දත්ත පදනම් කරගත් ප්‍රතිපත්ති සම්පාදනය සහ දැනුම්වත් ව තීරණ ගැනීමට සහාය වීම සඳහා සාර්ව ආර්ථික, මුදල්, මූල්‍ය, විදේශීය අංශය සහ මූර්ත අංශයේ වර්ධනයන් පිළිබඳ ව ආර්ථික පර්යේෂණ, මුදල් ප්‍රතිපත්තිමය හා අනෙකුත් විශ්ලේෂණ සහ තාක්ෂණික අධ්‍යයන සිදු කිරීම.
  - ආර්ථික හා සංඛ්‍යානමය දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය මෙන්ම දත්ත පද්ධති, විශ්ලේෂණාත්මක රාමු, ආකෘති සහ පුරෝකථන මෙවලම් ගොඩ නැගීමට සහ පවත්වාගෙන යෑමට දායකත්වය සැපයීම.
  - ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, ප්‍රතිපත්ති සම්පාදක මණ්ඩල සහ අදාළ පාර්ශ්වකරුවන් සඳහා උසස් තත්ත්වයේ වාර්තා, ප්‍රතිපත්ති පිළිබඳ සංක්ෂිප්ත ලේඛන, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය/පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන පත්‍රිකා, ඉදිරිපත් කිරීම් (presentations) සහ අනෙකුත් විශ්ලේෂණාත්මක ලේඛන සැකසීම.
- දත්ත ප්‍රකාශනය සහ බෙදාහැරීම
  - ආයතනික සහ ජාත්‍යන්තර අවශ්‍යතාවලට අනුකූලව, නිරවද්‍ය බව, විශ්වසනීයත්වය සහ විනිවිදභාවය සහතික කරමින් ආර්ථික සංඛ්‍යාලේඛන, පර්යේෂණාත්මක සොයාගැනීම් සහ ව්‍යවස්ථාපිත ප්‍රකාශන සම්පාදනය, බෙදාහැරීම සහ ප්‍රකාශයට පත්කිරීම.
- ආර්ථික සහ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් රජයේ නියෝජිතායතන, මූල්‍ය ආයතන, ජාත්‍යන්තර සංවිධාන සහ අනෙකුත් අදාළ පාර්ශ්ව ඇතුළු දේශීය සහ ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සමග සම්බන්ධ වීම සහ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.
- සිය වගකීම්වලට අයත් කරුණු සම්බන්ධයෙන් විශේෂඥ දැනුම සහ උපදෙස් ලබාදීමෙන් සහාය වන අතරම, තාක්ෂණික කමිටු, ක්‍රියාකාරී කණ්ඩායම්, දැනුම්වත් කිරීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන් සහ සහයෝගී පර්යේෂණ ක්‍රියාකාරකම්වල දී ආයතනය නියෝජනය කිරීම.
- කනිෂ්ඨ නිලධාරීන්ට මගපෙන්වීම, අධීක්ෂණය, පුහුණු සහ උපදේශකත්වය සැපයීම මගින් ඔවුන්ගේ වෘත්තීය හැකියා වර්ධනය, විශ්ලේෂණ හැකියා ශක්තිමත් කිරීම සහ ඉහළ කාර්යක්ෂමතාවකින් යුතු වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම.
- මෙම රැකියා විස්තරය මගින් තනතුරේ ප්‍රධාන කාර්යයන් සහ වගකීම් දක්වා ඇති අතර, රැකියාවේ විෂය පථය මෙම කරුණුවලට පමණක් සීමා නොවේ. තෝරාගනු ලබන අපේක්ෂකයා වෙත ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවලට අනුකූලව අවශ්‍ය පරිදි අමතර රාජකාරි සහ වගකීම් පවරනු ලැබිය හැකිය.

## 2.0 සුදුසුකම් සහ පළපුරුද්ද

### 2.1 අධ්‍යාපන සුදුසුකම්

- අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය වන විට ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයන්හි අධ්‍යයන ශ්‍රේණිගත කිරීම් [Academic Ranking of World Universities (ARWU)], QS ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් [QS World University Rankings (QSWUR)] හෝ ටයිම්ස් උසස් අධ්‍යාපන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් [Times Higher Education World University Rankings (THEWUR)] යන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල සමස්ත ශ්‍රේණිගත කිරීම (Overall ranking) අනුව 1–500 අතර ස්ථානයක් හිමි, ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආර්ථික විද්‍යාව හෝ ඊට අදාළ විෂය ක්ෂේත්‍රයක විශේෂීකරණය සහිත ශාස්ත්‍රපති (Master's) උපාධියක් **සහ/හෝ** ආචාර්ය (PhD) උපාධියක්.

**සහ**

- ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ අවම වශයෙන් දෙවන පංතිය ඉහළ පෙළ සාමාර්ථයක් (2nd Upper) හෝ ශ්‍රේණි ලකුණුවල සාමාන්‍යය (GPA) උපරිම 4.0 කින් අවම වශයෙන් 3.5 ක් හෝ බර තැබූ සාමාන්‍යය ලකුණු (WAM) අවම වශයෙන් 75% ක් සහිත, පහත සඳහන් විෂය ධාරාවන්ගෙන් එකක් සඳහා ලබා ගත් විශේෂ ප්‍රථම උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසර 03 ක් විය යුතුය.)
  - ආර්ථික විද්‍යාව
  - සංඛ්‍යානය / ගණිතය
  - ඉංජිනේරු විද්‍යාව
  - පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය / දත්ත විද්‍යාව
  - ගිණුම්කරණය / බැංකුකරණය / මූල්‍ය
  - වාණිජ්‍යය / කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය
  - රාජ්‍ය ප්‍රතිපත්ති

### 2.2 පළපුරුද්ද

- මෙම දැන්වීමේ පිළිවෙලින් 2.1 සහ 3.0 කොටස් යටතේ සඳහන් විශේෂීකරණ ක්ෂේත්‍රයන් සහ කුසලතා/ නිපුණතාවන්ගෙන් ඕනෑම එකකට අදාළව, ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු (post Bachelor's Degree) අවම වශයෙන් වසර පහක (05) අදාළ සේවා පළපුරුද්දක් තිබිය යුතුය. (එම වසර පහ (05)ක සේවා පළපුරුද්ද ගණනය කිරීමේදී, පූර්ණකාලීන පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා වැය කළ උපරිම වසර තුන (03)ක කාලය ද ඇතුළත් කරගත හැකි අතර ඊට අතිරේකව වසර දෙකක සේවා පළපුරුද්දක් තිබිය යුතුය.)

## 3.0 අවශ්‍ය කුසලතා / දක්ෂතා

- ඉහළ විශ්ලේෂණ සහ පර්යේෂණ කුසලතා
- ඉතා ඉහළ වාචික සහ ලිඛිත සන්නිවේදන කුසලතා
- කණ්ඩායම් සාමාජිකයෙක් වශයෙන් හෝ තනි පුද්ගලයෙකු ලෙස පීඩනය යටතේ කටයුතු කිරීමට ඇති හැකියාව

## 4.0 වයස

2026.08.23 දිනට වයස අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

## 5.0 සේවා නියුක්තිය

- තෝරාගනු ලබන සුදුසුකම්ලත් අපේක්ෂකයින්, පරිවාස කාලය සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ස්ථිර කාර්ය මණ්ඩලයට අනුයුක්ත කිරීම සඳහා සලකා බලනු ලැබේ. එසේ ස්ථිර කරනු ලබන නිලධාරීන්, කාර්ය මණ්ඩල ශ්‍රේණි II (සාමාන්‍ය සේවය) (Staff Class Grade II – General Service) වෙත පත් කරනු ලැබේ.

## 6.0 වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ

- මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ නිලධාරීන්ට අදාළ වැටුප් පරිමාණයන්ට අනුව හිමිවන ආකර්ෂණීය වැටුපක් සමඟ අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ, සේවක ණය පහසුකම්, විශ්‍රාම වැටුප් සහ පුහුණුවීම් අවස්ථා සඳහා හිමිකම් ලබනු ඇත.

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

නියමිත අවම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් ඉදිරි ඇගයීම් සඳහා කෙටි ලැයිස්තුගත (shortlist) කරනු ලබන අතර, එම ඇගයීම්වලට 'වෘත්තීය කුසලතා සහ පුද්ගල පෞරුෂ ඇගයීමේ මධ්‍යස්ථානයක්' (Profiling Centre) හරහා සිදු කරන ඇගයීම්, තාක්ෂණික නිපුණතා ඇගයීම් සහ සම්මුඛ පරීක්ෂණ ඇතුළත් විය හැක.

## තනතුරට අදාළ නියමයන් සහ කොන්දේසි

බඳවා ගනු ලැබූ අපේක්ෂකයන් වසර දෙකක (02) පරිවාස කාලයකට යටත් වන අතර, පරිවාස කාලය තුළ තෘප්තිමත් කාර්යසාධනය සහ හැසිරීමට යටත්ව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථිර සේවයේ, කාර්ය මණ්ඩල පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස පත් කිරීම සඳහා පරිවාස කාලය සාර්ථකව නිම කිරීමෙන් පසුව සලකා බලනු ලැබේ.

බඳවා ගනු ලබන අයදුම්කරුවන්ගේ මූලික අනුයුක්ත කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත සිදු කරන ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන්ට, මහ බැංකුවේ අදාළ ප්‍රතිපත්තිවලට අනුකූල ව සහ බැංකුවේ අවශ්‍යතාවයන් පරිදි දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු ලබා දීම සිදු කෙරේ.

## අයදුම් කිරීම

අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇති, ඉහත තනතුර සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන පුද්ගලයින් **2026.08.23 වන දින හෝ ඊට පෙර** පහත සබැඳිය ඔස්සේ පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

සබැඳිය - **https://www.cbsl.gov.lk/en/careers**

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී ඉහත සබැඳියේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසි වලට අනුගත වන ලෙසට අයදුම්කරුවන්ට උපදෙස් ලබා දෙනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා නොමැති අයදුම්කරුවන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබනු ඇත. අදාළ සුදුසුකම් සපුරා නොමැති හෝ අවසන් දිනට පසුව ලැබෙන හෝ නියමිත ආකෘතියට යටත් නොවන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්කරුවන් විසින් ඉහත තනතුර සඳහා අදාළ වන සුදුසුකම් සපුරා තිබීම තහවුරු කිරීම පිණිස අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද හා සේවා කාලය තහවුරු කරන ලියකියවිලිවල ස්කෑන් කරන ලද පිටපත් උඩුගත (upload) කළ යුතු අතර, ප්‍රකාශිත පර්යේෂණ/ව්‍යාපෘති පිළිබඳ තොරතුරු සහ තනතුරට ඇති සුදුසුකම් සම්බන්ධයෙන් තහවුරු කළ හැකි වෙනත් ඕනෑම තොරතුරක් ලබා දිය යුතු බව අවධාරණය කෙරේ. තනතුර සඳහා සලකා බැලීමට අවශ්‍යවන අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්දට අදාළ සහතික පත්‍රවල පිටපත් අමුණා නොමැති ඕනෑම අයදුම්පතක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම පියවරක දී පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයට පෙර පැවැත්වෙන සහතික පත්‍ර පරීක්ෂා කිරීමේ දී අදාළ සහතිකපත්‍රවල / ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් කිසිදු ආකාරයකින් තනතුර සඳහා අයදුම්කිරීමට සුදුසුකම් ලත් අයදුම්කරුවෙකු ලෙස නොසැලකේ.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ. බඳවා ගනු ලබන සංඛ්‍යාව තීරණය කිරීමේ, බඳවා ගැනීමේ ක්‍රියාවලිය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. අයදුම්පත් කෙටි ලැයිස්තුගත (shortlist) කිරීමේදී තනතුරේ අවශ්‍යතා මත පදනම් ව සුදුසුකම්වල (අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්වලින් ආවරණය වන විෂය ක්ෂේත්‍ර) සහ පළපුරුද්දේ අදාළත්වය තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා සම්බන්ධ කරගනු ලබන්නේ කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණි.

2023 අංක 16 දරන මහ බැංකු පනතේ 20 සහ 24 (1) වගන්ති සියලුම අයදුම්කරුවන්ට අදාළ වේ.

**අධ්‍යක්ෂ - මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01.**
**දු.ක - 011-247 7330 | ෆැක්ස් - 011-247 7715**